# පොල් ඉඩම් සංවර්ධන වැඩ පිළිවෙළක්

## දෙවන පන්තියේ පොල් ඉඩම්

පොල් ත්‍රිකෝණය කියල සඳහන් කරන කොළඹ, කුරුණෑගල සහ පුත්තලම ප්‍රදේශ වල පොල් ඉඩම් පළවෙනි හා දෙවෙනි කියල පංති දෙකකට බෙදල තියෙනව. පොල් වගාවට හොඳම පස හා දේශගුණය ඇති ඉඩම් පළවෙනි පංතියේ හැටියටත්, එපමණම සතුටුදායක පස හා හොඳ දේශගුණයක් නැති ඉඩම් දෙවන පංතියේ හැටියටත් වර්ග කෙරෙනව. දෙවන පංතියේ පොල් ඉඩම් හුඟක් දක්නට ලැබෙන්නේ කොළඹ දිස්ත්‍රික්කයෙයි. මෙම දිස්ත්‍රික්කයේ තනිකරම පොල් වගා කර තිබෙන අක්කර 1,17,000 කින් 84% ක්ම දෙවන පංතියට අයත් වනවා. පළවෙනි පංතියේ පොල් ඉඩමකින් අක්කර යකට පොල් ගෙඩි 5,000 සිට 6,000 දක්වා ප්‍රමාණයක් ලැබෙන අතර දෙවන පංතියේ පොල් ඉඩමකින් ලැබෙන්නේ 3,000 සිට 3,500 අතර ප්‍රමාණයක්.

## ආයතන අධ්‍යයනය

දෙවන පංතියේ පොල් ඉඩම් ඇති ප්‍රදේශයේ ඉඩම් සෑහෙන ප්‍රමාණයක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට පැවරුනා. මේ ඉඩම් අසල්වැසි ගම් සමග ඒකාබද්ධ කර ඒවා වැදගත් සමාජ – ආර්ථික මධ්‍යස්ථාන බවට පත් කිරී මෙන් පලදායීත්වයත්, රැකියා අවස්ථාවත් වැඩිකර ගත හැකි ක්‍රම හා මාර්ග පිළිබඳව සොයා බැලීමට **ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය** මගින් කළ අධ්‍යයනයෙන් හෙළි වූ තොරතුරු වලින් බිඳක් මතු දැක්වෙනවා.

## අධ්‍යයන ප්‍රදේශය

මිනුවන්ගොඩ, මීරිගම, දිවුලපිටිය සහ නිට්ටඹුව කෘෂිකාර්මික ව්‍යාප්ති ප්‍රදේශ මේ අධ්‍යයනය සඳහා තෝරා ගත්තා. මේ ප්‍රදේශවලිනුත් උල්ලලපොල මාබොදලේ, කොරසෙ, තැන්නෙගම, අම්බන සහ හුඹුටි යාව ගම් හය විස්තර සහිතව කරන අධ්‍යයන යකට යොමු වුනා. ඒ ප්‍රදේශයේ නොයෙකුත් ගම් අතර තිබෙන නියෝජන ස්වභාවයත්, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට පැවරුන ඉඩම් වටාපිටාවෙහි තිබීමත් මෙම ගම් තෝරා ගැනීමට තුඩු දුන්නා. මෙම ගම්වල ගෙහිමියන් 19 දෙනෙක් මේ සමීක්ෂණයට යොමු වුනා. අවශ්‍ය කරුණු සම්මුඛ සාකච්ඡා මගින් ඔවුන්ගෙන් ලබා ගත්තා.

## සාමාන්‍ය කරුණු

ඉස්සර පෞද්ගලික වතු යායවල්වලට මැදි වුණු ගම්මාන දුප්පත්කමින් මිරිකී සිටින ගැමි ජනතාවගෙන් ගහන ස්ථාන උනා. ඒ අතරම වතුයායවල් පොහොසත්කමින් හා සුඛිත මුදිත බවින් අග තැන්පත් ස්ථාන හැටි යට තිබුනා. මේ තත්වය දැන් ක්‍රමයෙන් වෙනස්වීගෙන යනවා. ගමත් වතුයායත් සමාජයීය, ආයතනික හා ආර්ථික අංශ වලින් ඒකාබද්ධ කිරීමට ඇති අවශ්‍යතාවය මේ අධ්‍ය යනයේදී ඉස්මතුව පෙනෙන එක කාරණයක්.

මේ පොල් ඉඩම්වල ඇති ගොවිපලවලත් ඉන් පිටස්තර අංශවලත් පලදායීතාවය හා සේවා අවස්ථා වැඩි කිරීමට ඇති හැකියාව, පොල් වගාව යට වෙනත් අතුරු බෝග වැවීමේ වැදගත්කම හා පොල් ඉඩම්වල සත්ව පාලනය මගින් ආදායම් හා සේවා අවස්ථා වැඩි කිරීමට ඇති හැකියාව ආදිය ගැනත් අධ්‍යයනයෙන් සොයා බලා තියෙනවා.

## සංවර්ධන යෝජනා

පොදුවේ සළකන කල මේ ඉඩම්වල ආදායම් මට්ටම සහ සේවා අවස්ථාවන් වැඩි කිරීමේ හැකියාවක් දක්නට ලැබෙනව. ඉඩම් ඌණ පරිහරණයකට ලක්ව ඇති පෙදෙස්වල වඩාත් හොඳ ඉඩම් පරිහරණ ක්‍රමයක් උපයෝගී කර ගැනීම හා කෘෂිකර්මය පදනම් වූ කර්මාන්ත සහ එම කර්මාන්ත අනුසාරයෙන් ඉදිරිපත් කරන වැඩපිළිවෙලක් මගින් මේ ඉඩම්

තවදුරටත් දියුණු කරන්න පුළුවනි.

මේ පොල් ඉඩම් ප්‍රදේශයේ වතුයායවල මෙන්ම කුඩා ඉඩම්වලත් නැවත පැල සිටුවීම, පෝර දැමීම හා පස සෝදා යාම වැළැක්වීමේ ක්‍රම අනුගමනය කිරීම ආදිය වැඩි කළ යුතුය. විශේෂයෙන් කුඩා පොල් ඉඩම් හිමියෝ පොල් පුනරුත්ථාපන යෝජනා ක්‍රමය යටතේ ලබාගත හැකි පහසුකම් ගැන අවබෝධයක් ලැබී නැති බව පෙනී ගොස් තියෙනවා.

## ඉඩම් උපයෝගීකරණය

ගොවිපල වැඩකටයුතු අතින් සළකා බලන කල කොළඹ දිස්ත්‍රික්කයේ දෙවන පංතියේ පොල් ඉඩම් පිහිටා ඇතිතේ වාසිදායක තත්ත්වයකයි. මෙම ඉඩම් කට්ටිවලට ළඟා විය හැකි හොඳ මාර්ග රටාවක් තිබීම, අවුරුද්දේ වැඩි කොටසක් තුළ සෑහෙන වර්ෂාපතනයක් ලැබීම, දුම්රිය ස්ථාන, නාගරික වෙළඳහල් වැනි ස්ථානවලට නුදුරුව පිහිටා තිබීම, කිරි, පළතුරු හා උක් සැකසුම් මධ්‍යස්ථාන ආසන්නව පිහිටා තිබීම ආදිය නිසා ගොවිපල ව්‍යාපාර පවත්වාගෙන යාම වඩාත් පහසුයි.

## අතුරු බෝග වැවීම

කෙටිකාලීන ආහාර බෝග සහ පළතුරු වගාව පොල් ඉඩම්වල වාසිදායක අයුරින් කළ හැකියි. හෙවනට ඔරොත්තු දෙන අල වර්ග හා කුළු බඩු බෝග ආදියත් වගා කිරීමට පිළිවනි. අන්නාසි, කෙසෙල්, බූලත්, උක් හා ගස්ලබු වැනි බෝගයක් මේ ඉඩම්වල වැවීමට නම් සෑහෙන මුදලක් වියදම් කළ යුතු වෙනවා. පාන් හා තිරිඟු පිටි තියෙන නිසා, සම්ප්‍රදායික අල වර්ගවලට ඒවා සමඟ තරඟයකට මුහුණ දීමට සිදුව තියෙනවා. කෙසේ වෙතත්, කහ සහ පළතුරු වැවීම වාසිදෙන ව්‍යාපාරයක් බව පෙනී යනවා. එළවළු අවාරයට, පහත රට එළවළු වර්ග පොල් ඉඩම්වල වගා කිරීමෙන් ද අමතර ආදායම් මාර්ගයක් ඇතිකර ගැනීමට ඉඩ තියෙනවා.

## සතුන් ඇති කිරීම

මේ ප්‍රදේශයේ යහපත් කෘෂි දේශගුණික තත්ත්වය නිසා කඳු රටෙහි හෝ වියළි කලාපයෙහි මෙන් නොව වඩාත් අඩු වියදමින් තෘණ වගාව දියුණු කළ හැකියි. සත්ව පාලන වැඩ සටහනකට බාධාවක් හැටියට ඇත්තේ, මූල ධනය හා කිරි හරක් හිඟකම සහ ගව ආහාරවල අධික වියදම යනාදියයි. ශ්‍රී ලංකා/ජාත්‍යන්තර සංවර්ධන අධිකාරියේ සහයෝගය ඇතිව දියත් කර ඇති කිරිපට්ටි සංවර්ධන වැඩ සටහනෙන්, මෙවැනි ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කරන අයට සහනයක් ලැබීමට ඉඩ තියෙනවා. සතුන් ඇති කිරීම පිළිබඳ පුහුණුව හා පශු වෛද්‍ය සේවා, කිරි අලෙවි පහසුකම් ආදිය සලසා දීම වැදගත් වෙනවා. අතුරු බෝග වගා කළ නොහැකි හෝ තෘණ වගාව දියුණු කළ නොහැකි වඩාත් වියළි පෙදෙස්වල, වැඩි වියදමක් ගෙන නොදෙන එළුවන් ඇති කිරීමෙන් අමතර ආදායමක් ලබා ගන්නට පිළිවනි.

## ඉඩම් ප්‍රතිසංස්කරණ ඉඩම්

දෙවෙනි පංතියේ පොල් ඉඩම් වලින් 30% 40% ක පමණ ප්‍රමාණයක් අතුරු බෝග වැවීම සඳහා සුදුසුයි. ප්‍රවේශමෙන් සැළසුම් කරන ලද ව්‍යාපාර කීපයක් එකවරම කර ගෙන යාමෙන් අක්කර 50 ක ඉඩමකින් (මෙයින් අක්කර 20ක් අතුරු බෝග සඳහාවෙන් කර) පුද්ගලයින් 20 දෙනෙකුට පමණ එක් අයෙකුට රු. 300–/ ක මාසික ආදායමක් ලබා ගන්නට පුළුවනි.

## කෘෂිකාර්මික කර්මාන්ත

පොල් අතුරු නිෂ්පාදන ගණනාවක් ආරම්භ කිරීමේ හැකියාව දෙවෙනි පංතියේ පොල් ඉඩම් පෙදෙස්වල දක්නට ලැබෙනවා. පොල් නිෂ්පාදන භාවිතයෙන් හකුරු, කොහු හා කොහු වලින් හදන අනෙකුත් භාණ්ඩ හා අතුරු කර්මාන්ත දියුණු කරන්න පුළුවනි. මයියොක්කා වවනව නම්, අතුරු නිෂ්පාදන හැටියට කැඳ වර්ග, සව්, පිටි හා සත්ව ආහාර දියුණු කිරීමේ කුඩා කර්මාන්ත ඇති කිරීමේ හැකියාව තියෙනවා. අත්තනගල්ල ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල ව්‍යාපාරය දැනටමත් මයියොක්කා වලින් කැඳ නිපදවීමේ ව්‍යාපාරයක් ආරම්භ කර තියෙනවා.